Faculty of Social Sciences
University of Kelaniya
Sri Lanka

# නැවත පදිංචි කිරීමේදී මතුවන ඉඩම් ගැටලු : වවුනියාව දිස්ත්‍රික්කය ඇසුරෙන්

***වී.ටී කුලසූරිය*** [1]
***එම්. කේ නදීකා දමයන්ති*** [2]

**සංක්ෂේපය**

කුමන හෝ ක්‍රියාවලියකින් අවතැන් වූ ජනතාව නැවත පදිංචි කිරීම බොහෝමයක් රටවල දැඩි කතාබහට ලක්වන මාතෘකාවක් වන අතර මෙය ක්‍රියාවලියක් වශයෙන් ලෙබනනය, ඉරාකය, සුඩානය, සිම්බාබ්වේ යනාදි බොහෝමයක් රාජ්‍යයන්වල ක්‍රියාත්මක වේ. බලහත්කාරයෙන් හෝ ස්වභාවික විපත් නිසා සිදු කෙරුණ මානව අවතැන්වීම ශ්‍රී ලංකාවට නව අත්දැකීමක් නොවේ. බොහෝ රටව නැවත පදිංචි ක්‍රියාවලිය තුළ ගැටලුකාරි තත්ත්වයන් හඳුනාගත හැකිය. මෙරට නැවත පදිංචි කරවීමේ දි මෑතකාලීනව දැඩි කතාබහට ක් වූ ප්‍රදේශයකි උතුරු නැගෙනහිර. අවතැන් වූවන් නැවත තම ගම් බිම් කරා පැමිණිය ද ඔවුන් නැවත පදිංචි කිරීමේ දි ඔවුන්ගේ ගැටලු සම්පූර්ණයෙන්ම නොවිසඳී ඇති ආකාරයක් දැකගත හැකි වේ. මෙහිදි ඉඩම් පරිහරණය පිළිබඳව ගැටලුව ප්‍රබලව ඉස්මතු වී  ඇතිබව එදිනෙදා සාකච්ඡාවන්හිදි මතුවන්නකි. මෙම අධ්‍යයනයේ මුලික අරමුණ වන්නේ නැවත පදිංචි කරවීමේ දි මතුවන ඉඩම් සම්බන්ධව ගැටලු හඳුනා ගැනීම හා එම ගැටලු ජනතාවගේ ජීවන තත්ත්වය කෙරෙහි කොතෙක් දුරට බලපාන්නේද? යන්න අධ්‍යයනය කිරීමයි. මෙම අධ්‍යයනය සඳහා දත්ත හා තොරතුරු රැස් කිරීමේ දි ප්‍රාථමික හා ද්විතියික දත්ත යොදා ගත් අතර ප්‍රාථමික දත්ත රැස් කිරීම ප්‍රශ්නාවලි ක්‍රමය හා සම්මුඛ සාකච්ඡා මඟින් ද, ද්විතියික දත්ත රැස් කිරීම වාර්ෂික වාර්තා, පුවත්පත් ලිපි, අන්තර්ජාලය ආදිය භාවිතා කරමින් සිදු කරන ලදි. මෙහිදි අධ්‍යයන ප්‍රදේශය වශයෙන් උතරු පළාතේ වවුනියාව දිස්ත්‍රික්කයේ ප්‍රාදේශයී ලේකම් කොට්ඨාසවල නැවත පදිංචි කිරීමේ ගම්මාන අතුරින් පන්රිකෙයිදකුලම, බෝගස්වැව, මල්මඩුව හා ආසිකුලම යන ගම්මාන අහඹු ලෙස තෝරාගත් අතර එම ගම්මානවලින් ගමකින් පවුල් විස්සක් බැගින් අහඹු ලෙස තෝරා ගැනිනි. ඒ අනුව මුළු නියැදිය අසූවකි. අධ්‍යයනයේ දත්ත හා තොරතුරු විශ්ලේෂණය සඳහා ප්‍රමාණාත්මක  හා ගුණාත්මක දත්ත දෙවර්ගයම භාවිතා කරනු ලැබේ. ප්‍රමාණාත්මක දත්ත සරල සංඛ්‍යාන විධික්‍රමය තුළින් ප්‍රස්තාර, වගු, ප්‍රතිශත භාවිතා කරමින් දත්ත විශ්ලේෂණය කරන ලදී. ගුණාත්මක දත්ත විශ්ලේෂණය කරනු ලැබුවේ විස්තරාත්මක ක්‍රමවේදය අනුවය. වවුනියාව දිස්ත්‍රික්කයේ නැවත පදිංචි කිරීමේ දි ඉඩම් සම්බන්ධයෙන් පවතින ගැටලු කිහිපයකි. එනම් නැවත පදිංචි කරන්නන්ට අයත්ව තිබූ ඉඩම් වෙනත් පුද්ගලයන් විසින් අත්පත් කරගෙන තිබීම (48%), රජය විසින් ඔවුන්ට තිබූ ඉඩම් අත්පත් කරගැනීම (12%),පදිංචි ඉඩම් සඳහා ස්ථිර ඔප්පු ලබා නොදීම (54%) යනාදි ගැටලු අධ්‍යයනයෙන් හඳුනාගත් ප්‍රධාන ගැටලු වේ.

ප්‍රමුඛ පද : අවතැන්වීම, නැවත පදිංචි කිරීම, ඉඩම්, වවුනියාව දිස්ත්‍රික්කය

1. ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය
2. ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය